රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 16/2008

මගේ අංකය : EST 5/2/3/1/1
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2008.08.22

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## 1994 සිට 1996 දක්වා කාලපරිච්ඡේදය තුල සිදුකරන ලද වැටුප් සංශෝධන නිසා ඇතිවී තිබෙන වැටුප් විෂමතා

1994 සිට 1996 දක්වා රාජ්‍ය සේවයේ සිදුකර ඇති සමහර වැටුප් සංශෝධනයන් ක්‍රියාත්මක වීමට පෙර උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට වඩා සාපේක්ෂ වශයෙන් වැඩි වැටුපක්, එම වැටුප් සංශෝධනය ක්‍රියාත්මක වීමෙන් පසුව උසස්වීම් ලැබූවන්ට ලැබීමෙන්, ඇති වී තිබෙන විෂමතාව ඉවත් කිරීම සඳහා ජාතික වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශයන් මත පහත සඳහන් විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත.

02. 1994.07.01, 1994.08.01 සහ 1995.01.01 යන දිනයන්හිදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සිදුකර ඇති වැටුප් සංශෝධන අදාල වූ තනතුරකට එදිනට පෙර උසස්වීම ලැබුවාවූද, යම් හෙයකින් එම උසස්වීම, එම වැටුප් සංශෝධනයට පසුව ලැබුණේ නම් වැඩි වැටුපක් ලැබීමට ඉඩ තිබුණාවූද නිලධාරීන්ට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල වේ.

03. ඉහත 02 වන ඡේදයේ සඳහන් වැටුප් සංශෝධන අදාල වූ තනතුරක, වැටුප් සංශෝධනයට පෙර සේවය කර, වෙනත් සේවාවකට/තනතුරකට/ශ්‍රේණියකට උසස්වීම නිසා එම වැටුප් සංශෝධන ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වූ නිලධාරීන්ට අදාල විය යුතු වැටුප් තීරණය කිරීමේ කාර්ය සඳහා පමණක්, එම වැටුප් සංශෝධනයට පසු යෙදෙන ආසන්නතම වැටුප් වර්ධක දිනයෙහි උසස් වූවා සේ කල්පිත පදනම මත සැලකිය යුතුය.

උදා : (I) මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ I පන්තියේ සිට 1993.10.01 දින ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට උසස්වීමක් යටතේ පත්වීමක් ලැබ් ඇත්නම් මෙම චක්‍රලේඛය යටතේ වැටුප් පරිවර්තන කාර්යය සඳහා එම උසස්වීම 1994.10.01 දින ලැබුවා සේ සැලකිය යුතුය.

(II) සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ සිට 1989.01.01 දින ශ්‍රී ලංකා පරිපාලන සේවයට උසස්වීමක් යටතේ පත්වීමක් ලැබ් ඇත්නම් මෙම චක්‍රලේඛය යටතේ වැටුප් පරිවර්තනය කිරීමේ කාර්යය සඳහා එම උසස්වීම 1995.01.01 දින ලැබුවා සේ සැලකිය යුතුය.

04. දැනට උසස්වීම ලැබ් ඇති දින සිට ඉහත 03 ඡේදයේ සඳහන් පරිදි උසස්වීම ලැබුවා සේ කල්පිත වශයෙන් සැලකෙන දිනය දක්වා වැටුප් වර්ධක උපයා ගැනීම සඳහා නියමිත සියලු අවශ්‍යතා සපුරා තිබුණේ නම් එවකට ක්‍රියාත්මකව පැවති විධිවිධාන යටතේ ලබා දිය හැකි වැටුප් වර්ධක උසස්වීමට පූර්වාසන්නයේ දැරූ තනතුර/ශ්‍රේණියට අදාල වූ වැටුප් පරිමාණය මත කල්පිත පදනමින් ලබාදිය යුතුය. ඒ අනුව නියමිත වැටුප ඉහත 03 වන ඡේදයේ සඳහන් පදනම මත කල්පිත වශයෙන් උසස්වීම ලැබෙන දින සිට ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය යටතේ කල්පිත පදනම මත පරිවර්තනය කල යුතුය.

"කෙසේ වතුදු උසස්වීම් ලබන ශ්‍රේණිය/සේවාව/තනතුර සඳහා වැටුප් වර්ධක හිමි වනුයේ ඉහත සඳහන් පරිදි කල්පිත පදනමින් උසස්වීම ලැබූ සේ සලකන ලද දිනය පදනම් කර ගෙන බව ද, ඇත්ත වශයෙන් උසස්වීම ලද දිනය හා කල්පිත දිනය අතර කාලය සඳහා උසස්වීම් ශ්‍රේණියට අදාල වැටුප් වර්ධක හිමි නොවන බව ද සටහන් කර ගත යුතුය."

05. ඉහත 04 වන ඡේදය යටතේ අදාල වන වැටුප් පරිමාණය මත වැටුප් වර්ධක උපයාගෙන ඇත්නම් කල්පිත පදනමින් එම කාලපරිච්ඡේදයට අදාල විධිවිධානයන්ට අනුකූලවන සේ වැටුප් වර්ධක ලබාදිය යුතුය. එම කාලපරිච්ඡේදය තුළ වෙනත් උසස්වීමක් ලැබී ඇත්නම් එම උසස්වීම යටතේ වැටුප් පරිවර්තනය කිරීම සඳහාද මෙම වැටුප යොදගත යුතුය.

06. මෙම චක්‍රලේඛය යටතේ සංශෝධනය වන වැටුප යටතේ 2008.08.31 දින දක්වා කිසිදු හිඟ මුදලක් නොගෙවිය යුතු අතර, 2008.09.01 දින සිට හිඟ වැටුප් ගෙවිය හැකිය.

07. මෙම විධිවිධාන අදල වන 2008.09.01 දිනට පෙර විශ්‍රාම ලැබුවන්ගේ විශ්‍රාම වැටුපද සංශෝධනය කර 2008.09.01 දින සිට ගෙවීම් කිරීමට පියවර ගත යුතුය.

08. මෙම චක්‍රලේඛය යටතේ අදල වන වැටුප් හා වැටුප් වර්ධක දිනය මත නිලධාරියෙකුගේ ජ්‍යෙෂ්ඨත්ව අනුපිළිවෙලෙහි හෝ 2008.08.31 දින දක්වා ලබාදී ඇති උසස්වීම්වල කිසිදු වෙනසක් සිදු නොවිය යුතුය. වැටුප් තීරණය කිරීම හැර ජ්‍යෙෂ්ඨත්වය තීරණය කිරීම් ආදී කාර්යයන් සඳහා අදල විය යුත්තේ මෙහි 02 වන ඡේදයේ සඳහන් වැටුප් සංශෝධනයන්ට පූර්වාසන්නයේ උසස්වීම් ක්‍රියාත්මක වූ දිනයයි.

09. මෙම චක්‍රලේඛය නිකුත් කිරීම සඳහා හේතුපාදක වූ උසස්වීම් හා වැටුප් සංශෝධනය කළ යුතු තනතුරු කිහිපයක් මගපෙන්වීමක් වශයෙන් ඇමුණුම් 1 හි දක්වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් බැහැරව සිදුකරන ලද වැටුප් සංශෝධන මත මෙම විෂමතාව අදල වන වෙනත් තනතුරු හෝ සේවාවන් තිබේනම් ඒ පිළිබඳව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව කරුණු අධ්‍යයනය කර නිර්දේශයක් කෙරෙනු ඇත. එබඳු කරුණු තිබේනම් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකළ යුතුය.

10. මෙම චක්‍රලේඛයේ කාර්ය සඳහා පමණක් අදල නිලධාරීන් ඉහත 03 ඡේදයේ සඳහන් ඔවුන්ට අදල වැටුප් සංශෝධනය සිදුවන දිනය දක්වා, පහළ තනතුරේ සිටියා සේ සලකනු ලැබේ. එසේම මෙම චක්‍රලේඛය අදල වන්නේ මෙහි 02 වන ඡේදයේ සඳහන් වැටුප් සංශෝධන ක්‍රියාත්මක වන දිනයන්හිදී සේවයේ නියුක්තව සිටි නිලධාරීන්ට පමණි.

11. මෙම චක්‍රලේඛය යටතේ වැටුප් සංශෝධනය කිරීම සඳහා අදල නිලධාරීන් විසින් ඉල්ලීමක් අදල ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම චක්‍රලේඛයේ 03 ඡේදයේ උදහරණ (I) අදල වන නිලධාරියකු විසින් ඉදිරිපත් කළ යුතු ආදර්ශ ඉල්ලීමක් ඇමුණුම 2 හි දක්වේ.

12. මෙම චක්‍රලේඛයේ කාර්යයන් සඳහා "උසස්වීම" යන්නට සේවාවක්/තනතුරක් තුළ ශ්‍රේණිගත උසස්වීම් මෙන්ම සීමිත හෝ කුසලතා පදනම මත වෙනත් සේවාවකට/තනතුරකට කෙරෙන උසස්වීම්ද ඇතුළත් වේ.

13. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම 1

| අදාළ චක්‍රලේඛය හෝ වැටුප් සංශෝධනයට යොමුව | වැටුප් සංශෝධනයට පෙර දැරූ තනතුර, සේවාව හෝ ශ්‍රේණිය | උසස්වීම ලබා ඇති තනතුර, සේවාව හෝ ශ්‍රේණිය | කල්පිත වශයෙන් වැටුප පරිවර්තනය කළ යුතු පදනම |
|---|---|---|---|
| රා.පරි.චක්‍රලේඛ 27/94, 27/94(I) | මධ්‍යම මට්ටමේ කාර්මික සේවාව 1 පන්තිය | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය II/II ශ්‍රේණිය<br>ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය II/II ශ්‍රේණිය<br>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය II/II ශ්‍රේණිය | 1994.07.01 දිනට පෙර 3 වන තීරුවේ සඳහන් තනතුරට උසස්වීම 1994.07.01 දිනට පසු ලැබුණේ යයි සැලකීම - චක්‍රලේඛයේ 03 ඡේදයේ උදාහරණය බලන්න. |
| රා.පරි.චක්‍රලේඛ 29/94, 29/94(II), 29/94(III) | සාමාන්‍ය ලිපිකාර සේවය අධි ශ්‍රේණිය | ශ්‍රී ලංකා පරිපාලන සේවය II/II ශ්‍රේණිය<br>ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය II/II ශ්‍රේණිය | 1994.08.01 දිනට පෙර 3 වන තීරුවේ සඳහන් තනතුරකට උසස්වීම 1994.08.01 දිනට පසු ලැබුණේ යයි සැලකීම |
| රා.පරි.චක්‍රලේඛ 33/95 | සහකාර/ලියාපදිංචි වෛද්‍ය II ශ්‍රේණිය | සහකාර/ලියාපදිංචි වෛද්‍ය I ශ්‍රේණිය | 1995.01.01 දිනට පෙර 3 වන තීරුවේ සඳහන් ශ්‍රේණියට උසස්වීම 1995.01.01 දිනට පසු ලැබුණේ යයි සැලකීම |
| රා.පරි.චක්‍රලේඛ 33/95 | බලයලත් නිලධාරි - ආගමන හා විගමන පාලක දෙපාර්තමේන්තුව | සහකාර ආගමන හා විගමන පාලක (දෙපාර්තමේන්තුමය) ආගමන හා විගමන පාලක දෙපාර්තමේන්තුව | 1995.01.01 දිනට පෙර 3 වන තීරුවේ සඳහන් තනතුරට උසස්වීම 1995.01.01 දිනට පසු ලැබුණේ යයි සැලකීම |

<u>ඇමුණුම 2</u>

# ආදර්ශ අයදුම් පත්‍රය

......................................................................

......................................................................

......................................................................

## මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ සිට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II/II ශ්‍රේණියට උසස්වීම යටතේ වැටුප් පරිවර්තනය - රා.ප.ච. 16/2008

මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ I පන්තියේ සිට 1993.10.01 දින ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II/II ශ්‍රේණියට උසස් වූ මගේ වැටුප ඉහත සඳහන් චක්‍රලේඛය යටතේ පහත දැක්වෙන පරිදි පරිවර්තනය කර දෙන මෙන් ඉල්ලමි. වැටුප් පරිවර්තන සඳහා අවශ්‍ය තොරතුරු පහත සඳහන් කරමි.

| | |
|---|---|
| උසස්වීම ලද දිනය | : 1993.10.01 |
| ලබමින් සිටි වැටුප් පරිමාණය | : එස්-3-7 - රු. 42720-12x1200-57120 |
| ලබමින් සිටි වැටුප් පියවර | : රු. 51120.00 (උදාහරණයක් පමණි) |
| උසස්වීම යටතේ පිහිටුවා ඇති වැටුප් පියවර | : රු. 53880.00 |
| වැටුප් සංශෝධනයට අදාළ චක්‍රලේඛ | : රා.ප.ච. 27/94, 27/94(I), <u>30/99, 30/99(I)</u> |
| සංශෝධිත වැටුප | : රු. 52320-15x1560-75720 |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට උසස් නොවී නම් ලැබෙන වැටුප | : රු. 71040.00 |
| කල්පිත වශයෙන් උසස්වීම ලැබුණේ යයි සැලකිය යුතු දිනය | : 1994.10.01 |
| කල්පිත වශයෙන් උසස්වීම යටතේ අදාල විය යුතු වැටුප | : රු. 72600.00 |

ඉහත සඳහන් පරිදි අදාල වැටුප් පියවරේ තබා ........................ දින සිට නියමිත පරිදි ගෙවීම් කරන මෙන් ඉල්ලමි.

නිලධාරීගේ අත්සන

දිනය :